කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි තෙවන වසර පරීක්ෂණය (බාහිර)-2016

2022 - මැයි

**BCOM E 3035 - උසස් මූල්‍ය ගිණුම්කරණය**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව හතරයි : (04) කාලය : පැය 03 යි

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

අ. මූල්‍ය ගිණුම්කරණයේ සංකල්පීය රාමුව යනු කුමක් ද ? මූල්‍ය ගිණුම්කරණයේදී සංකල්පීය රාමුවක් අවශ්‍ය වන්නේ ඇයි?

(ලකුණු 05යි.)

ආ. මූල්‍ය වාර්තාකරණයේදී මිණුම් පදනමක් තෝරා ගැනීමේදී සලකා බැලියයුතු සාධක සැකවින් විස්තර කරන්න.

(ලකුණු 07යි.)

ඇ. ගිණුම්කරණ තොරතුරුවල ගුණාත්මක ලක්ෂණ නම් කර ඒවා කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 13යි.)

**(මුළු ලකුණු 25යි.)**

ප්‍රශ්න අංක - 02

ඇලෙක්සා සමගම 2020.04.01 දින බ්ලේක්සා සමාගමේ ශුද්ධ වත්කම්වලින් 75%ක් අත්පත් කර ගත්තේය. අත්පත් කරගත් දිනය වන විට බ්ලේක්සා සමාගමෙහි ශුද්ධ අලාභය රු. 512,000 කි. අත්පත් කර ගන්නා දිනයේ දී පාලනය නොවන හිමිකමේ සාධාරණ වටිනාකම රු. 950,000 කි. 2021 මාර්තු 31 දිනෙන් අවසන් වූ වසර සඳහා ඇලෙක්සා සමාගම් සමූහයේ මූල්‍ය ප්‍රකාශන ඔබට පහත පරිදි ලබා දී ඇත.

2021 මාර්තු 31න් අවසන් වසර සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශය

| | ඇලෙක්සා<br>රු. | බ්ලේක්සා<br>රු. |
|---|---|---|
| ආදායම | 13,568,226.00 | 10,420,712.00 |
| විකුණුම් පිරිවැය | 10,221,430.00 | 8,111,900.00 |
| දළ ලාභය | **3,346,796.00** | **2,308,812.00** |

| | | |
|---|---|---|
| වෙනත් අදායම් | 132,000.00 | 4,500.00 |
| පරිපාලන වියදම් | 943,236.00 | 622,900.00 |
| බෙදාහැරීමේ වියදම් | 1,028,328.00 | 712,800.00 |
| **මෙහෙයුම් ලාභය** | **1,507,232.00** | **977,612.00** |
| මූල්‍ය වියදම් | 323,450.00 | 488,950.00 |
| **බදු පෙර ලාභය** | **1,183,782.00** | **488,662.00** |
| බදු | 428,200.00 | 94,500.00 |
| **බදු පසු ලාභය** | **755,582.00** | **394,162.00** |

2021 මාර්තු 31න් අවසන් වසර සඳහා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

| | ඇලෙක්සා<br>රු. | බ්ලේක්සා<br>රු. |
|---|---|---|
| ප්‍රකාශ කල ප්‍රාග්ධනය | 6,000,000.00 | 3,000,000.00 |
| රඳවාගත් ලාභය | - | - |
| 2020.04.01 දිනට ශේෂය | 1,512,854.00 | 1,472,900.00 |
| ශුද්ධ ලාභය | 755,582.00 | 394,162.00 |
| ගෙවූ ලාභාංශ | 156,000.00 | 100,000.00 |
| 2021.03.31 දිනට ශේෂය | **2,112,436.00** | **1,767,062.00** |
| | **8,112,436.00** | **4,767,062.00** |

2021.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

| | ඇලෙක්සා<br>රු. | බ්ලේක්සා<br>රු. |
|---|---|---|
| වත්කම් | | |
| ජංගම නොවන වත්කම් | | |
| දේපල පිරියත හා උපකරණ | 4,325,270.00 | 4,328,150.00 |
| ආයෝජන - බ්ලේක්සා | 2,450,000.00 | |
| වෙනත් ආයෝජන | 185,000.00 | 75,000.00 |
| | **6,960,270.00** | **4,403,150.00** |
| ජංගම වත්කම් | | |
| තොගය | 822,600.00 | 612,850.00 |
| වෙළෙඳ ණයගැතියෝ | 456,750.00 | 343,600.00 |
| බ්ලේක්සාට දුන් ණය | 500,000.00 | |

| | | |
|---|---|---|
| | | |
| සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබිය යුතු මුදල් | 121,500.00 | - |
| මුදල් හා මුදල් සමාන දෑ | 377,466.00 | 677,362.00 |
| | **2,278,316.00** | **1,633,812.00** |
| | **9,238,586.00** | **6,036,962.00** |
| **මුළු වත්කම්** | | |
| **ස්කන්ධය හා වගකීම්** | | |
| **ස්කන්ධය** | | |
| ප්‍රකාශකළ ප්‍රාග්ධනය | 6,000,000.00 | 3,000,000.00 |
| රදවාගත් ලාභය | 2,112,436.00 | 1,767,062.00 |
| | **8,112,436.00** | **4,767,062.00** |
| **ජංගම නොවන වගකීම්** | | |
| පොලී සහිත ණය | 256,320.00 | 292,000.00 |
| | | |
| **ජංගම වගකීම්** | | |
| පොලී සහිත ණය | 361,680.00 | 645,000.00 |
| වෙළෙඳ ණයහිමියෝ | 383,500.00 | 288,950.00 |
| සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු මුදල් | - | 1,500.00 |
| බදු | 124,650.00 | 42,450.00 |
| | **869,830.00** | **977,900.00** |
| මුළු හිමිකම් සහ වගකීම් | **9,238,586.00** | **6,036,962.00** |

අතිරේක තොරතුරු

1. අත්පත් කරගත් දිනයේ, බ්ලේක්සා සමාගමෙහි ගොඩනැගිල්ල රු. 2,800,000කට ප්‍රත්‍යාගණනය කර ඇත. 2021.03.31 දිනට, බ්ලේක්සා සමාගමෙහි පොත් වල පහත ශේෂයන් පෙන්වයි.
   ගොඩනැගිල්ල - රු. 3,000,000
   ගොඩනැගිල්ල ක්ෂය සඳහා වෙන් කිරීම - රු. 600,000 කි.
   බ්ලේක්සා සමාගම ඔවුන්ගේ වත්කම් සරල මාර්ග ක්‍රමය මත 5% අනුපාතයකින් ක්ෂය කරයි.

2. බ්ලේක්සා සමගම වර්ෂය තුළ රු. 600,000 ක් පිරිවැය වන භාණ්ඩ ඇලෙක්සා සමාගම වෙත 20% දළ ලාභ ආන්තිකයක් සමඟ අලෙවි කලේය . එම භාණ්ඩවලින් 15%ක් 2021.03.31 දිනට ඇලෙක්සා සමාගමේ අවසාන තොගයේ ඉතිරිව ඇත.

3. වසර තුළ ඇලෙක්සා සමාගම රු. 600,000ක් පිරිවැය වන භාණ්ඩ රු. 700,000 කට බ්ලේක්සා සමගමට විකුණා ඇත. එම භාණ්ඩවලින් 10%ක් 2021.03.31 දිනට බ්ලේක්සා සමාගමේ අවසාන තොගයේ ඉතිරිව ඇත.

4. 2020 ඔක්තෝම්බර් 01 වන දින බ්ලේක්සා සමගම විසින් 10% පොලී සහිත රු.250,000ක ණය මුදලක් ඇලෙක්සා සමාගම වෙතින් ඉදිරි මාස දොළහ ඇතුළත ආපසු ගෙවීමේ ගිවිසුමක් මත ලබා ගෙන ඇත.

5. වර්ෂය තුළ ඇලෙක්සා සමාගමෙහි හඳුනාගෙන ඇති වාර්තාගත නොවූ මුදල් ප්‍රමාණය රු. 120,000 කි. එය 2021 මාර්තු 30 වන දින ඇලෙක්සා වෙත ගෙවිය යුතු මුදල පියවීමක් සඳහා බ්ලෙක්සා ලිමිටඩ් විසින් කරන ලද මුදල් ගෙවීමකි.

ඔබ විසින් පහත දෑ පිළියල කල යුතුය.

අ. 2021.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඇලෙක්සා සමූහයේ ඒකාබද්ධ විස්තීරණ ආදායම් ප්‍රකාශය

ආ. 2021.03.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ඇලෙක්සා සමූහයේ ඒකාබද්ධ හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය

ඇ. 2021.03.31 දිනට ඇලෙක්සා සමූහයේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය ප්‍රකාශය

**(මුළු ලකුණු 30යි.)**

**ප්‍රශ්න අංක 03**

2016 ජූලි 01 දින තම ව්‍යාපාරය සංස්ථාගත කළ විදාන සමාගම 2021 මාර්තු 31 වැනි දින තම සමාගම ඇවර කිරීමට තීරණය කළේය. ඔවුන් 2021 මාර්තු 31 වැනි දින ඔවුන්ගේ අවසන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය සකස් කළ අතර, ඔවුන් සංස්ථාගත කිරීමෙන් පසු නව වරණීය කොටස් සහ සාමාන්‍ය කොටස් නිකුත් කර නොමැත. විදාන සමාගමේ 2021.03.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය ලබා දී ඇත.

සීමාසහිත විදාන සමාගම

2021.03.31 දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය (රු. 000')

| | | |
|---|---|---|
| <u>වත්කම්</u> | | |
| <u>ජංගම නොවන වත්කම්</u> | | |
| ඉඩම් | 2,880 | |
| ගොඩනැගිලි | 11,520 | |
| පිරියත හා යන්ත්‍රසූත්‍ර | 38,880 | |
| උපකරණ | 2,880 | 56,160 |

| | | |
|---|---|---|
| **ජංගම වත්කම්** | | |
| තොගය | 11,386 | |
| ණය ගැතියෝ | 16,560 | |
| බැංකු ශේෂය | 4,320 | |
| | | 32,266 |
| | | **88,426** |
| **ස්කන්ධය හා වගකීම්** | | |
| **ස්කන්ධය** | | |
| වරණීය කොටස් ප්‍රාග්ධනය | 28,800 | |
| (14%, රු.100 බැගින් වූ වරණීය කොටස් 288,000ක් සම්පූර්ණයෙන්ම ගෙවා ඇත) | | |
| **සාමාන්‍ය කොටස් ප්‍රාග්ධනය** | | |
| රු.100 බැගින් වූ සාමාන්‍ය 342,480ක් සම්පූර්ණයෙන්ම ගෙවා ඇත | 34,248 | |
| හිග හිටි ඇරයුම් | (90) | |
| සංචිත | ( 16,878) | 46,080 |
| **ජංගම නොවන වගකීම්** | | |
| 14%, පාවෙන අගයන් මත සුරක්ෂිත කර ඇති රු.100 ණයකර | 16,560 | |
| 10%, ඉඩම් මත උකස් ණය | 2,250 | |
| 12%, ගොඩනැගිලි මත උකස් ණය | 8,550 | 27,360 |
| **ජංගම වගකීම්** | | |
| වෙළෙඳ ණය හිමියෝ | 1,056 | |
| ගෙවිය යුතු වරණීය කොටස් ලාභාංශ | 4,006 | |
| ගෙවිය යුතු අධ්‍යක්ෂ වේතන (මාස 6ක) | 676 | |
| ගෙවිය යුතු වැටුප් හා වේතන (මාස 6ක) | 5,400 | |
| ගෙවිය යුතු ණයකර පොලී | 2,318 | |
| අදායම් බදු | | |
| 2018/19 | 900 | |
| 2019/20 | 450 | |
| 2020/21 | 180 | 14,986 |
| | | **88,426** |

2021 ජුනි 30 වන දින සමාගම ඇවර කරන ලද අතර .2007 අංක 07 දරණ සමාගම් පනතේ 283 වගන්තියේ අවශ්‍යතාවයන්ට අනුව සමාගමේ ලේකම්වරයා පහත තොරතුරු භාවිතා කරමින් සමාගම් කටයුතු පිළිබඳ ප්‍රකාශය සහ අනෙකුත් ලේඛන ඉදිරිපත් කිරීමට නියමිතය.

i. වත්කම්කවල උපලබ්ධි වටිනාකම්

ඉඩම-රු.4,500,000
ගොඩනැගිල්ල-රු. 8,100,000
පිරියත සහ යන්ත්‍රෝපකරණ -රු.33,750,000
උපකරණ-රු.2,160,000
තොග-රු.6,750,000

ii. උකස් ණය සඳහා උපචිත පොලී 2021 ජුනි 30 දක්වා ගෙවිය යුතුය. 2021 මාර්තු 31 දක්වා පොළිය සම්පූර්ණයෙන්ම ගෙවා ඇත.

iii. වෙළඳ ණයගැතියන්ගේ මුදල් ලැබීම් මත පදනම්ව ඔවුන් හොඳ ණය ගැතියන්, අඩමාන ණය ගැතියන් සහ බෝල් ණය ලෙස විශ්ලේෂණය කර ඇත. එක් එක් ණය ගැති කාණ්ඩයේ ප්‍රමාණය පහත පරිදි වේ.

හොඳ ණය ගැතියන් - රුපියල් 9,900,000

අඩමාණ ණය ගැතියන් -රු. 4,725,000 (මෙයින් 75%ක් ලබාගැනීමට ඇස්තමේන්තු කර ඇත.)

ඉතිරි ණය ගැතියන් බෝල් ණය ලෙස සලකනු ලැබේ

iv. සමාගම කොටස් හිමියන්ගෙන් හිඟ මුදල් කැඳවා ඇති අතර, ඔවුන්ගෙන් රුපියල් 67,500 ක් ලබා ගැනීමට ඇස්තමේන්තු කර ඇත.

v. ප්‍රමාද ගාස්තු ඇතුළුව රුපියල් 1,080,000ක් ණයහිමියන් වෙත ගෙවිය යුතුය.

vi. අධ්‍යක්ෂවරයා ඔහුගේ උපචිත වැටුප ලෙස රුපියල් 630,000ක් ලැබීමට එකඟ විය.

vii. ණයහිමියන් සහ අධ්‍යක්ෂවරුන්ගේ උපචිත වැටුප හැර අනෙකුත් වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශය අනුව සම්පූර්ණයෙන්ම පියවිය යුතුය.

viii. සමාගමට වාර්තා නොකළ ණය ගැතියෙකුගෙන් රුපියල් 99,000 ක් ලැබිණි.

ix. නීතිමය ගෙවීම් සඳහා රු. 112,500 ක් වූ අසම්භාව්‍ය වගකීමක් ඇති අතර, රුපියල් 99,000 ක් ඒ සඳහා ගෙවීමට ඇස්තමේන්තු කර ඇත.

x. 2021.03.31 දිනට රඳවාගත් ලාභ ශේෂය සඳහා පහත හේතු බලපා ඇත.

2016/17 - සමාගමට රු. 23,400,000 වෙළඳ ලාභයක් සහ රු. 4,500,000 පොදු සංචිතයක් තිබුණි. වසර අවසානයේ ඔවුන් රු. 6,300,000 සාමාන්‍ය කොටස් සහ වරණීය කොටස් ලාභාංශ ප්‍රකාශයට පත් කළහ.

2017/18 - වසර අවසානයේදී සමාගමට රු. 2,250,000 වෙළඳ ලාභයක් හිමි වූ අතර ඔවුන් රු. 90,000 ක තොග හානියකට මුහුණ දුන්හ. ඔවුන් සාමාන්‍ය කොටස් සහ වරණීය කොටස් ලාභාංශ රු. 4,950,000 ක් ප්‍රකාශ කළහ.

2018/19 - සමාගමට රු. 900,000 ක වෙළඳ පාඩුවක් තිබූ අතර වසර අවසානයේදී ඔවුන් රු.4,006,000 වරණීය කොටස් ලාභාංශ ප්‍රකාශයට පත් කරන ලදී.

2019/20 - සමාගමට රු. 11,250,000 ක වෙළඳ පාඩුවක් තිබූ අතර වසර අවසානයේදී ඔවුන් රු.4,006,000 වරණීය කොටස් ලාභාංශ ප්‍රකාශයට පත් කරන ලදී.

2020/21 - සමාගමට රු. 11,520,000 ක වෙළඳ පාඩුවක් තිබූ අතර වසර අවසානයේදී ඔවුන් රු.4,006,000 වරණීය කොටස් ලාභාංශ ප්‍රකාශයට පත් කරන ලදී.

ඉහත තොරතුරු භාවිතා කොට, ඔබ විසින් පහත දෑ පිළියල කල යුතුය.

අ. සමාගම් කටයුතු පිළිබඳ ප්‍රකාශය

ආ. ඌනතා හෝ අතිරික්ත හා ගිණුම

**(මුළු ලකුණු 30 යි.)**

ප්‍රශ්න අංක **04**

අ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත අංක 10 ට අනුව මව් සමාගමකට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ වගකීම අත්හල හැකි ව්‍යතිරේක නිර්ණායක ලැයිස්තුගත කරන්න.

**(ලකුණු 05 යි.)**

ආ. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත අංක 03 ට අනුව ව්‍යාපාර සංයෝජන සඳහා ගිණුම් තැබීමේදී අත්පත් කර ගැනීමේ ක්‍රමය යටතේ එන අවශ්‍යතාවන් 04 ක් පැහැදිලි කරන්න.

**(ලකුණු 10 යි.)**

**(මුළු ලකුණු 15 යි.)**